13 JUL 2016

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2016-07-11 |

පැමිණිලිකරු : අජිත් කේ. තිලකරත්න මයා,
ප්‍රධාන ලේකම්,
අධ්‍යාපන අනධ්‍යයන සේවක සංගමය,
අලවතුගොඩ.

වගඋත්තරකරුවන් : අධ්‍යක්ෂ ජනරාල්,
කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය,
මහා භාණ්ඩාගාරය,
කොළඹ 01.

<u>පැමිණිලි අංකය : HRC/925/13</u>

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ තනතුරු කිහිපයක් වන සනීපාරක්ෂක කම්කරු, පුස්තකාල සේවක, පුස්තකාල සහයක, කම්කරු, රසායනාගාර සේවක වැනි තනතුරු අහෝසි කොට පාසැල් කාර්ය සහයක ලෙස එක් තනතුරක් ඇති කිරීම තුළින් සේවකයින්ට විශාල අගතියක් සිදුව ඇති බවයි. ඒ අනුව එම තනතුරු නාමයන් වෙනස් කර ගැනීම හා කාර්ය සහයක නමින් හඳුන්වා ඇති පොදු නාමය ඉවත් කර ගැනීම මෙම පැමිණිල්ල මඟින් අපේක්ෂා කරන බවද පැමිණිල්ලේ දක්වා ඇත.

ඒ අනුව පැමිණිලිකරු වැඩිදුරටත් සඳහන් කර ඇත්තේ මෙම තනතුරු නාම අහෝසි කිරීම තුළින් පාසැල් හා කලාප කාර්යාල ආදි ස්ථාන වල පරිපාලන ගැටළුවක් ඇතිවන බවත්, රාජකාරි ඉටු කිරීම සිදුවීම නිශ්චිතව නොවීමද, එක් එක් තනතුරු සඳහා බඳවා ගත් අධ්‍යාපනික හා වෘත්තිය සුදුසුකම් අහෝසි වී යාමද වැටුප් තල අතර වෙනස්කම් පැවතීමද සිදුවන බවත්ය. එසේම වගඋත්තරකරුවන් විසින් වෘත්තිය සමිති නියෝජනයකින් තොරව කටයුතු කරමින් පැසැල් කාර්ය සහයක ලෙස පොදු නාමයක් තැබීම හේතුවෙන් පැසැල් පරිපාලනය නිසි ලෙස සිදු නොවන බවද සඳහන් කර ඇත. තවද පාසැල් සඳහා පත්වීම් පිරිනමනු ලබන්නේ දේශපාලන හිතවත්කම් මත බවද දේශපාලන ලැයිස්තු මත පැමිණි නවක සේවකයින් තනතුරු වලට පත් කිරීමේදී ගැටළු මතුවන බවද වැඩිදුරටත් සඳහන් කර ඇත.

මෙම පැමිණිල්ලට අදාළව කරුණු ඉදිරිපත් කරමින් වගඋත්තර පාර්ශවය විසින් සඳහන් කර ඇත්තේ, අධ්‍යාපන අනධ්‍යයන සේවක කාර්ය මණ්ඩල වලට අයත් තනතුරු වශයෙන් පැවැති සනීපාරක්ෂක කම්කරු, පාසැල් කම්කරු, සමාන්‍ය කම්කරු, කාර්යාල කම්කරු, උද්‍යාන කම්කරු, විද්‍යාගාර සේවක හා සහයක පුස්තකාල සේවක හා සහයක අරක්කැමි යන තනතුරු අහෝසි කිරීමක් සිදුකර නොමැති බවද එම තනතුරු නාම ඒකාබද්ධ කර පැසැල් කාර්ය සහයක ලෙස තනතුරු නාමය පමණක් සංශෝධනය කළ බවත් පළාත් පාසැල් වර්ගීකරණය පදනම් කරගෙන එසේ සිදුකරන ලද්දේ පාසැල් සඳහා අවශ්‍ය වඩාත් හොඳ අනධ්‍යන කාර්ය මණ්ඩලයක් සකසා ගැනීම සඳහා වන බවත්ය.


...ධාන කාර්යාලය / ...தான அலுவலகம் / ...ad Office : 165, කිංසි පාර, කොළඹ - 08. / 165, கின்சி வீதி, கொழும்பு - 08. / 165, Kynsey Road, Colombo - 08.
සභාපති / தலைவர் / Chairman : 011-2696470
ෆැක්ස් / தொலைநகல் / Fax : 011-2696470
ඊමේල් / மின்னஞ்சல் / e-mail : sechrc@sltnet.lk
...රකථන / ...லைபேசி / ...one : 94 - 11 - 2694925, 2685980, 2685981
ලේකම් / செயலாளர் / Secretary : 011-2689558
ක්ෂණික / துரித அழைப்பு / Hotline : 011-2689558, 1996
වෙබ් / இணையம் / Web : www.hrcsl.lk

ඒ අනුව අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ තීරණය කිරීමට පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යංශයද ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව ද මුදල් කොමිෂන් සභාවද කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවද එකඟව ගන්නා ලද තීරණයක් මත පළාත් සභා කාර්ය මණ්ඩල සමාලෝචනයේදී මෙම තනතුරු නාම සංශෝධනය සිදුකළ බවද දක්වා ඇත. පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරුන්ද ආයතන ප්‍රධානීන් ද සහභාගී වෙමින් සිදුකළ ඉහත සඳහන් කාර්ය මණ්ඩල සමාලෝචනයේදී පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ පාසැල් අධ්‍යයන කාර්ය මණ්ඩලය තීරණය කිරීම සඳහා සාධාරණ වූ නිර්ණායකයන් මත තීරණය කර සකස් කළබවද වගඋත්තරකරුවන් විසින් දන්වා ඇත.

තනතුරු නාමය වෙනස් කිරීමෙන් ගැටළුවක් හෝ බාධාවක් පාසැල් පරිපාලනයට සිදු නොවන බවද කම්කරු වැනි තනතුරු නාම වෙනුවට පාසැල් කාර්ය සහයක යන නාමය එකී රැකියාවේ නියුතු අයගේ මානසික තත්වය ඉහළ දැමීමට හේතු වන බවද වගඋත්තරකරුවන් විසින් පෙන්වා දී ඇත. එසේම මෙසේ ඒකාබද්ධ කරන ලද තනතුරු සඳහා බඳවා ගැනීමේ පටිපාටි තුළ අධ්‍යාපනික හා වෘත්තිය සුදුසුකම් අහෝසි නොවන බවද සේවකයින්ගේ අයිතිවාසිකම් වලට බාධාවක් අධ්‍යාපන සුදුසුකම් අනුව සිදු නොකරන බවද පෙන්වා දී ඇත.

තවද සියළුම තනතුරු සඳහා බලපාන්නා වූ වැටුප් කාණ්ඩය වන්නේ 6/2006 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ PL යන කාණ්ඩය බැවින් ඉන් වෙනස්කමක් කිසිවෙකුටත් සිදු නොවන බවද පෙන්වා දී ඇත.

පැමිණිලිකරුවන් තම පැමිණිල්ලේ දක්වා ඇති කරුණු වන රාජකාරිමය වශයෙන් කිසිදු වෙනසක් සිදු නොකළයුතුය යන්න පිළිබඳව දක්වා තිබූ කොන්දේසි අනුව තනතුරු නාම පමණක් සංශෝධනය කරනු ලබන යෝජනාව යහපත් රාජ්‍ය සේවයකට හා පැසැල් පරිපාලනයකට සුදුසු නොවන බවද වගඋත්තරකරුවන් විසින් පෙන්වා දී ඇත.

දෙපාර්ශවය විසින් ඉදිරිපත් කරන ලද කරුණු දැක්වීම අනුව කොමිෂන් සභාව විසින් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

1. පළාත් පාලන අමාත්‍යංශ හා ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවද මුදල් කොමිෂන් සභාව හා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවද පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් හා ආයතන ප්‍රධානීන්ගේද සහභාගීත්වය ඇතිව ගන්නා ලද තීරණයක් මත පාසැල් අනධ්‍යන කාර්ය මණ්ඩලයේ වෙන් වෙන් වශයෙන් පැවැති තනතුරු කිහිපයක් හැඳින්වීමට පොදු තනතුරු නාමයක් ලබා දීමට වගඋත්තර පාර්ශවයන් විසින් කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ.

මේ අනුව පැමිණිල්ලේ දක්වා ඇති පරිදි අනධ්‍යයන කාර්ය මණ්ඩලයට අයත් තනතුරු වශයෙන් පැවැති සනීපාරක්ෂක කම්කරු, පාසැල් කම්කරු, සාමාන්‍ය කම්කරු, කාර්යාල කම්කරු, උද්‍යාන කම්කරු, විද්‍යාගාර සේවක/සහායක, පුස්තකාල සේවක/සහයක, අරක්කැමි යන තනතුරු අහෝසි වීමක් සිදුකර ඇති බවට දක්වා ඇතත්, ඉහත කරුණු අනුව එවැනි තනතුරු අහෝසි කිරීමක් සිදුව නොමැති අතර තනතුරු නාම හඳුන්වන පොදු නාමයක් පමණක් ඇතිකර තිබීමක් සිදුකර ඇති බවට නිරීක්ෂණය වේ. එබැවින් පැමිණිලිකරුවන් දක්වන පරිදි පැමිණිලිකරුවන් සිටි තනතුරේ ගුණාත්මකභාවයට හානියක් සිදුව තිබීම යන කාරණය බැහැර කළ යුතු බවට කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

2. නමුත් එතෙක් පැවැති කම්කරු, උද්‍යාන කම්කරු, පාසැල් කම්කරු, සාමාන්‍ය කම්කරු, විද්‍යාගාර සේවක හෝ සහයක අරක්කැමි, පුස්තකාල සේවක හා සහයක වැනි තනතුරු වෙත පොදු තනතුරු නාමයක් ඇති කළද බඳවා ගැනීමේදී ඒ ඒ තනතුරු සඳහා වෙන වෙනම අදාල තනතුරු වලට හිමි සුදුසුකම් යටතේ බඳවා ගැනීම සිදුකරන අතර වෙන වෙනම ඇති තනතුරු සඳහා වෙන් වූ රාජකාරී පැහැදිලි කළ බඳවා ගැනීමේ පටිපාටියකට අනුව කටයුතු කරන බව නිරීක්ෂණය වේ. එවිට සනීපාරක්ෂක කටයුතු සිදුකරන සේවකයාගේ කාර්යය ද පුස්තකාල

කිරීම සපුරා තහනම් අධ්‍යාපන සේවක සංගමය අලවතුගොඩ, මහනුවර

සේවකයා හා රසායනාගාර සේවකයා වෙන් වෙන්වද කටයුතු කරනු ලබන බව පැහැදිලි වේ. යහපත් සනීපාරක්ෂක කටයුතු නිසි පිළිවෙලකට පවත්වාගෙන යා යුතු බව දක්වා ඇති අතර, එය මෙම පාසැල් කාර්ය සහයක තනතුරු නාමය යටතේ රාජකාරී කටයුතු කරනු ලබන සනීපාරක්ෂක කටයුතු වලට අදාළ සේවකයා විසින් නිසි ලෙස සිදුකළයුතුව ඇත.

ඒ අනුව පොදු තනතුරු නාමයක් වූ පාසල් කාර්ය සහයක යන්න තුළ විවිධ රාජකාරී කටයුතු කරන අයගේ රාජකාරියේ ස්වභාවය වෙනස් නොවන බැවින් පැමිණිලිකරුවන් දක්වන පරිදි පොදු තනතුරු නාමය තුළ සියළු තනතුරු වල කටයුතු කළයුතු බවට කරනු ලබන කරුණු ඉදිරිපත් කිරීම පිළිගත හැකි කාරණයක් නොවන බව කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

තවද පැමිණිලිකරුවන් පොදු නාමය යටතේ බඳවා ගැනීමේදී අදාළ සුදුසුකම් අනුව බඳවා ගන්නා බැවින් පැමිණිල්ලේ දක්වා ඇති පරිදි පුස්තකාලයාධිපති තනතුර සඳහා හෝ පුස්තකාල සේවාව සඳහා බඳවා ගැනීමේ ගැටළු ඇති නොවන බවද නිරීක්ෂණය වේ.

3. පොදු තනතුරු නාමය යටතේ වැටුප් සම්බන්ධ ගැටළුවක් ඇති වන බවට පැමිණිල්ලෙන් පෙන්වා දී ඇතත්, බඳවා ගන්නා තනතුරු සඳහා බඳවා ගැනීමේ පටිපාටියට අනුව සහ 6/2006 වැටුප් චක්‍රලේඛනයට අනුව කටයුතු කරන බැවින් එවැනි ගැටළුවක් මතුවිය හැකි බවක්ද කොමිෂන් සභාව නිරීක්ෂණය නොකරයි.

4. එසේම වැටුප් සැකසීමේදී තනතුරු සියල්ල ඒකාබද්ධ කිරීමක් සිදුවන බවට පැමිණිලිකරුවන් විසින් දක්වා ඇතත්, ඉදිරිපත්ව ඇති කරුණු අනුව එවැනි ආකාරයට තනතුරු සියල්ල ඒකාබද්ධ කිරීමක් සිදුවන බවට නිරීක්ෂණය නොවේ.

5. තවද පාසල් පත්වීම් ලබා දීමේදී දේශපාලන හා පුද්ගලික හිතවත්කම් සිදු කරන බව පැමිණිලිකරුවන් විසින් දක්වා ඇතත්, එය තහවුරු කිරීමක් සිදුව නොමැත. එසේම බඳවා ගැනීමේ පටිපාටිය හේතුවෙන් දැඩි ව්‍යාකූලතාවයක් ඇති වන බවට පැමිණිල්ලේ දක්වා ඇතත්, බඳවා ගැනීමේදී ඒ සඳහා වූ පටිපාටි හා චක්‍රලේඛ අනුව සිදුකරන බවට නිරීක්ෂණය වන බැවින් එවැනි ගැටළුකාරී තත්වයක් මතුවන බවක් නිරීක්ෂණය නොවේ.

6. තවද අදාළ පොදු නාමය වෙනස් කිරීම සම්බන්ධයෙන් වෘත්තීය සමිති සහභාගී කරවා නොගත් බවට පැමිණිල්ලේ දක්වා ඇතත්, එය මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් යටතේ විමසීමට ලක්කළ හැකි කාරණයක් නොවන බවද කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

මෙකී සමස්ථ කරුණු කෙරෙහි කොමිෂන් සභාවේ අවධානය යොමු කිරීමේදී පැමිණිලිකරුවන් සඳහන් කරන පරිදි මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් සිදුව ඇති බවට කරුණු අනාවරණය වී නොමැත.

ඒ අනුව මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් යටතේ තවදුරටත් මෙ සම්බන්ධයෙන් මැදිහත් වීමේ හැකියාවක් නොවන බැවින් මෙම ගොනුවේ කටයුතු අවසන් කරන බව කාරුණිකව දැනුම් දෙමි.

සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

B/

Dr. N. D. Udagama
Chairperson
Human Rights Commission of S

අන්සතු කිරීම සපුරා තහනම්
අධ්‍යාපන සේවක සංගමය
අලවතුගොඩ, මහනුවර